# විශේෂ මහසභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2018.08.23**
**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීශාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. **ප්‍රේමදාස** මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. බලංගොඩ නගර සභාව සතු පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ගැනීම.**

ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් 2018.08.23 දින විශේෂ මහ සභාවක් රැස්කිරීමට හේතු සාධක වූ අරමුණු පහදා දෙමින්, මීට ඉහත බලංගොඩ නගරය පිරිසිදු කිරීමේ කසළ ටෙන්ඩරය කරන ලද ටෙන්ඩර්කරුගේ අපරික්ෂාකාරි හා අක්‍රමවත් සේවය හා ගිවිසුමේ කොන්දේසි කඩකිරීම හේතුවෙන් ඔහු ටෙන්ඩරයෙන් ඉවත්කල බැවින් ඔහු විසින් කරගෙන යන ලද වැසිකිළි ටෙන්ඩරයෙන් ද ඔහු ඉවත් වී ඇති බව පවසා සිටින ලදී.එමනිසා එහි නඩත්තු කටයුතු පවත්වා ගෙන යමින් වැසිකිලි ටෙන්ඩරයේ කටයුතු සිදු කිරීමට කසල ටෙන්ඩරයේ වර්තමාන ටෙන්ඩර්කරු වන ආර්.කේ.ජයසුන්දර යන අයටම මෙම වසරේ එනම් 2018.12.31 දක්වා වැසිකිලි ටෙන්ඩරයේ කටයුතු ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ස්ථිර කරන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් පාසල් ළමුන් සඳහා නොමිළේ වැසිකිලි පහසුකම් ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමන් විසින් වැසිකිලි ටෙන්ඩරයේ මාසික ටෙන්ඩර් මුදල හා පොදු වැසිකිලි භාවිතා කරන්නෙකු සඳහා අයකරන ගාස්තුව විමසා සිටි අවස්ථාවේ ඒ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් වැසිකිලි ටෙන්ඩරයේ මාසික මුදල වැට් හා එන්.බී.ටී. සමඟ රු.153,000.00 කට පමණ ආසන්න වන බවත්, පොදු වැසිකිලි භාවිතා කරන්නෙකු සඳහා අයකරන උපරිම මුදල රු.10.00 ක් බවත් පවසා සිටින ලදී. **සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**02. ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ පැවැත්වෙන එක්සත් නගර හා ප්‍රාන්ත ආසියා පැසිෆික් කළාප රැස්වීම සඳහා ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමාගේ නම යෝජනා ස්ථිර කර ගැනීම.**

ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ 2018.09.11 දින සිට 2018.09.16 දින දක්වා පැවැත්වෙන එක්සත් නගර සහ ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගී වීම සඳහා ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා සහ ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා සහභාගි කරවීම සුදුසු බවට 2018.08.08 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 04:02:01

යටතේ සම්මත වූ නමුත් එම දිනයන්හි ගරු සභාපතිතුමාට විශේෂ රාජකාරියක් පැවරී ඇති හෙයින් ඒ සඳහා සහභාගි විය නොහැකි බැවින් ඉහත සඳහන් කළාප රැස්වීම සඳහා පක්ෂයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා වන ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා සහභාගි කරවීම සුදුසු බවත්,ඒ සඳහා වියදම් සභා අරමුදලින් දැරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු සභාපතිතුමා විසින් පෙ.ව. 11.00 ට පමණ මෙදින විශේෂ මහ සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.